බැංකු පනත් විධාන 2018 අංක 03 2018 ජුනි 05

## මෝටර් රථ සම්බන්ධ ණය පහසුකම් සඳහා වටිනාකම මත ණය අනුපාතය පිළිබඳ විධාන සඳහා සංශෝධන

2018 අංක 1 දරණ මෝටර් රථ සම්බන්ධව ණය පහසුකම් සඳහා වටිනාකම මත ණය අනුපාතය පිළිබඳ බැංකු පනත් විධාන පහත පරිදි සංශෝධනය කර ආදේශනය කරන ලදී.

3. වටිනාකම මත ණය අනුපාතයෙන් නිදහස් කිරීම

3.1 ඉහත සඳහන් විධාන 2 හි ඇතුළත් වන සීමාවන් පහත ණය පහසුකම් සඳහා අදාළ නොවේ.

(i) සංචාරක ක්ෂේත්‍රයේ සහ/හෝ ප්‍රවාහන ක්ෂේත්‍රයේ ප්‍රධාන ව්‍යාපාරික කටයුතු සඳහා යොදා ගැනීම පිණිස මෝටර් රථ සමූහ මිලදී ගැනීමට ණය පහසුකම් ලබා ගැනීමේදී එසේ මිලදී ගන්නා මෝටර් රථ ලියාපදිංචියේ සිට වසරක් ගතවීමට පෙර වෙනත් පුද්ගලයෙකුට හෝ ආයතනයක් වෙත නොපැවරීමට යටත්ව සහ,

(ii) මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය විසින් සඳහන් කර ඇති මූල්‍ය කල්බදු ක්‍රමයක් යටතේ රජයේ ආයතන සඳහා වාහන ප්‍රසම්පාදන කටයුතුවලදී.

3.2 මෙලෙස ණය පහසුකම් ලබා දීමේදී බලපත්‍රලාභී බැංකු විසින් අභ්‍යන්තර සීමා සහ ප්‍රමාණවත් අවදානම් කළමනාකරණ ක්‍රමවේදයක් අනුගමනය කළ යුතු වේ.

අත්සන් කළේ,
ආචාර්ය ඉන්ද්‍රජිත් කුමාරස්වාමි
**මුදල් මණ්ඩලයේ සභාපති සහ**
**ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති**